## ලංකාවේ සමාජ මාධ්‍ය හා  වෛරී කථනය

ලංකාව තුළ පැවති සිවිල් යුද්ධය අවසන්වී දශකයකට වැඩි කාලයක් ගෙවී ගොසිනි. දශක තුනක යුද්ධයකින් අනතුරුව සමාජයක් වශයෙන් විදි වේදනාවන් ගෙන් මිදී අප සමාජයක් වශයෙන් සුවපත්වනවා වෙනුවට වඩ වඩා වෛරය වපුරන සමාජයක් දක්වා නැවත ගමන්කොට ඇත. ශිල්පා සමරතුංග සහ සංජන හත්තොටුව විසින් සිදුකරන ලද ශ්‍රී ලංකාව තුළ ෆේස්බුක් අඩවියෙහි සිදු වන වෛරී කථනය පිළිබඳ අධ්‍යයනයක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් 2014 සැප්තැම්බර් මාසයේදී නිකුත් කරන ලදී. එම අධ්‍යනය පෙන්වා දෙන ආකාරයට සාමාන්‍යයෙන් මුස්ලිම් විරෝධී වෛරී කථනය යුද්ධයේ උපරිම අවස්ථාවේ පැවති එල්ටීටීඊ විරෝධී හැඟීම්වලටත් වඩා ගුණාත්මක වශයෙන් කුරිරු හා විසකුරු වේ.

 දශක තුනක යුද්ධයක් අවසන්වී අප සමාජයක් වශයෙන් ගමන්කර ඇත්තේ මෙවැනි අන්තයකටය.

රට තුළ සමාජ මාධ්‍යය පරිහරණය කරන්නන් වඩ වඩා වේගයෙන් වැඩි වීමත් සමග ඔන්ලයින් සංවාද මණ්ඩප තුළ වෛරය, අනර්ථය හා හිංසාව වර්ධනය වෙමින් හා පැතිරෙමින් පවතින්නේ සංකීර්ණ ස්වභාවයකින් බව, එම තත්ත්වය විශේෂයෙන් ම වඩාත් ම කාරුණික තරුණ ජන කොටසක් තුළ ගැඹුරු හා මුල් කාලීන මතවාදීමය පෙරළිකාරීත්වයකට දායක වන බව සහ එම පෙරළිකාරීත්වය වෙනත් විවිධ මාධ්‍ය හා උපක්‍රම ගණනාවක් හරහා අන්තවාදී ක්‍රියාකාරකයන්ට පසු කාලයේ දී ගසා කෑ හැකි සරු පසක් බවට පත් වන බව ශිල්පා සමරතුංග සහ සංජන හත්තොටුව ගේ අධ්‍යයනය පෙන්වා දෙයි.

### ලංකාව තුළ සමාජ මාධ්‍යන්ගේ ව්‍යාප්තිය

පසුගිය දශකය තුළ ලංකාවේ අන්තර්ජාලය භාවිතය විශාල වශයෙන් වර්ධනය වී ඇති අතර එහි අතුරු නිෂ්පාදනයක් වන සමාජ මාධ්‍ය භාවිතයේද සුවිශාල වර්ධනයක් පසුගිය වසර පහ තුළ අපට හදුනාගත හැකිය. සමාජ ජාල විශ්ලේෂක නාලක ගුණවර්ධන සඳහන් කරන පරිදි 2015 වසර වන විට ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාලය භාවිත කළ පිරිස මුළු ජනගහනයෙන් 25% කි. 2019 වන විට එම ප්‍රතිශතය 33% - 35% දක්වා ඉහළ ගොස් ඇතැයි පවසන ඔහු ඉන් අති බහුතරය අවම වශයෙන් එක් සමාජ ජාලයක් හෝ භාවිත කරන බව පෙන්වා දෙයි.

2018 මහබැංකු වාර්ථාව පෙන්වාදෙන පරිදි 2018 වර්ශය වන විට ලංකාවේ ජංගම දුරකතන සම්බන්දතාවයන් මිලියන 32.5 දක්වා වැඩිවී ඇති අතර ස්ථාවර දුරකථන සම්බන්දතාවයන් 4.6 % කින් පහතවැටී ඇත. ස්ථාවර දුරකථන සම්බන්දතාවයන් මිලියන 2.5 දක්වා පහත වැටී ඇත

2018 වර්ශයේදී සමස්ත අන්තර්ජාල සම්බන්ධතාවයන්   2.3 % වර්ධනය වී ඇත. 2018 වර්ෂය අතරතුරදී ස්ථාවර අන්තරජාල සම්බන්දතාවයන් 1,530,099 දක්වා වර්ධනයවී ඇති අතර ජංගම අන්තර්ජාල සම්බන්දතාවයන් 5,733,062 දක්වා ඉහල ගොස් ඇත.  මෙම වර්ධනයන් සමඟ ස්ථාවර දුරකථන විනිවිද යාම සහ ජංගම දුරකථන විනිවිද යාම පිළිවෙලින් 11.5 සහ 150.1 ලෙස සමස්තයක් වශයෙන් 161 දක්වා ඉහළ ගොස් ඇත. මේ අතර, අන්තර්ජාලය විනිවිද යාම (පුද්ගලයින් 100 දෙනෙකු සඳහා සම්බන්ධතා වශයෙන්) 2017 අවසානයේ 27.5 ට සාපේක්ෂව 2018 අවසන් වන විට එය 33.5 වි ඇත (ශ්‍රී ලංකා මහ බැංකුව,2018)

Sri Lanka Together වෙබ් අඩවිය පෙන්වාදෙන පරිදි ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාලය භාවිතා කරන පිරිස මිලියන 7.3කි. එය ලංකාවේ සමස්ත ජනගහනයෙන් 34% කි. ශ්‍රී ලංකාවේ වැඩිම පිරිසක් භාවිත කරන සමාජ ජාලය ෆේස්බුක් වන අතර එම පිරිසෙන් 63% ක් අවුරුදු 18 ත් 34 ත් අතර වයසේ පසුවන්නන්ය. ජංගම දුරකථන සබදතා ප්‍රමාණය මිලියන 28.7 ක් වන

අතර එය ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන් 137 % කි. ක්‍රියාශීලී සමාජ ජාලා පරිශීලකයින් සංඛ්‍යාව මිලියන 62 ක් වන අතර දුරකථන ඔස්සේ පැමිනෙන පරිශීලකයින් සංඛ්‍යාව මිලියන 5.7 කි.

නැපෝලියන්කැට් වෙබ් අඩවිය පෙන්වාදෙන ආකාරයට (NapoleonCat.) 2019 ජුනි මාසයේදී ශ්‍රී ලංකාවේ ෆේස්බුක් භාවිතා කරන්නන් 5,454,000 ක් සිටි අතර එය ජනගහනයෙන් 25.9% කි. ඔවුන්ගෙන් බහුතරය පිරිමින් (67.8%) ය. වයස අවුරුදු 25 ත් 34 ත් අතර පුද්ගලයින් විශාලතම පරිශීලක කණ්ඩායම විය (1,980,000 එනම් 36.3%). පිරිමින් සහ කාන්තාවන් අතර ඉහළම වෙනස පෙන්වන්නේ වයස අවුරුදු 25 ත් 34 අතරය. එහිදී පුරුෂයින් 620,000 ක් (පිරිමින් 1,298,052 කට සාපේක්ෂව ස්ත්‍රීන් 681,750 ක් වන අතර එය 23.8 % හා 12.5 % වේ).

පසුගිය වසර කිහිපය තුළ ලංකාවේ ජංගම දුරකතන හා සම්බන්ද ජංගම අන්තර්ජාල සම්බන්දයන්ගේ වර්ධනයත් සමග වට්ස්ඇප් සහ  වයිබර් වැනි සමාජ මාධ්‍යන් භාවිතයේද විශාල වර්ධනයක් සිදුවී ඇත.

පසුගිය දශකය තුළ  ලංකාවේ සමාජ මාධ්‍ය භාවිතය තුළ සිදුවෙමින් පවතින මෙම විශාල වර්ධනය යහපත් සමාජයක් සඳහා අවශ්‍ය කෙරෙන සමාජ වටිනාකම් සහ ආකල්පයන් වර්ධනය කිරීමට ඉවහල් වන මෙවලමක් වශයෙන් භාවිතා වීමකට වඩා දශක තුනක යුද්ධයකට පසුවත් සමාජය තුළ අනෙකාට එරෙහිව පවතින වෛරය ප්‍රතිනිශ්පාදනය කිරීමට ඉවහල් වන මෙවලමක් වශයෙන් භාවිතා වෙමින් පවතී. මෙවැනි සන්ධර්බයක් තුළ ලංකාවේ සමාජ මාධ්‍යයන් හරහා ප්‍රකාශයට පත්වන වෛරී කථනයේ ස්වරූපයන් පිළිබඳව ගැඹුරින් විමසා බැලීම වැදගත්ය.

**වෛරී කථනය යනු කුමක්ද ?**

ෆේස්බුක් අඩවිය වෛරී කථනය අර්තකථනය කරන ආකාරය මෙසේ ය.

“ජාතිය, ජනවාර්ගිකත්වය, ජාතික සම්භවය, ආගමික අනුග්‍රහය, ලිංගික දිශානතිය, කුලය, ලිංගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය සහ බරපතල රෝග හෝ ආබාධිත බව යන පදනම් මත පදනම් වූ පුද්ගලයන්ට එරෙහි සෘජු ප්‍රහාරයක් ලෙස අපි වෛරී කථාව අර්ථ දක්වමු. වයස තවත් ආරක්ෂිත ලක්‍ෂණයක් සමඟ යුගලනය වන විට අපි වයස අනුව පහරදීම් වලින් ආරක්ෂා වන අතර සංක්‍රමණික තත්ත්වය සඳහා යම් ආරක්ෂාවක්ද සපයන්නෙමු. අපි ප්‍රහාරය අර්ථ දක්වන්නේ ප්‍රචණ්ඩකාරී හෝ අමානුෂික කථාවක්, හානිකර ඒකාකෘති, පහත් ප්‍රකාශ හෝ බැහැර කිරීම හෝ වෙන් කිරීම සඳහා වන ඉල්ලීම් ලෙස ය.”

එක්සත් ජාතීන්ගේ වෛරී කථනය සම්බන්දයෙන් වන උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම නමින් 2019 මැයි මස නිකුත් කරන ලද ලේඛණය තුළ වෛරී කථනය යනු කුමක්ද ?  යන්න මෙසේ පැහැදිලි කරයි “වෛරී කථනය පිළිබඳ ජාත්‍යන්තර නෛතික අර්ථ දැක්වීමක් නොමැත, වෛරය යන්නෙහි සවභාවය මතභේදාත්මක හා විවාදාත්මකය. මෙම ලේඛනයේ සන්දර්භය තුළ වෛරී කථනය යන යෙදුම, කථනය, ලිවීම හෝ හැසිරීම පිළිබඳ ඕනෑම ආකාරයක සන්නිවේදනයක් ලෙස වටහා ගැනෙයි. පුද්ගලයෙකුට හෝ කණ්ඩායමක් සම්බන්දයෙන් ඔවුන් කවුරුන්ද යන්න මත පදනම්ව  නොසලකාහරින හෝ වෙනස්කොට සලකන ආකාරයේ භාෂාවක් භාවිතාකරන්නේ හෝ භාෂාවකින් පහර දෙන, වෙනත් ආකාරයකට කිවහොත් ඔවුන්ගේ ආගම, ජනවාර්ගිකත්වය, ජාතිකත්වය, ජාතිය, වර්ණය, සම්භවය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වෙනත් අනන්‍යතා සාධක මත පදනම් වීමයි.”

නව සංනිවේදන තාක්ෂණයේ ව්‍යාප්තියත් සමග  වෛරී කථනයේ නව බලවේගයක් වශයෙන් “සයිබර් වෛරය “ වර්ධනය වෙමින් පවතී. ඔන්ලයින් ලෝකයෙන් පරිභාහිරව පවතින ලෝකය(ඕෆ් ලයින් ලෝකය) තුළ සිදුවන විනාශකාරී ප්‍රතිවිපාකයන් සමග වේගයෙන් ව්‍යාප්ත වීමේ හැකියාව මෙම “සයිබර් වෛරය “ සතුය. අපහාස-විරෝධී ලීගය විසින් “සයිබර් වෛරය “ අර්තකථනය කර ඇත්තේ  “යුදෙව් විරෝධී, ජාතිවාදී, ආදානග්‍රාහී, අන්තවාදී හෝ ත්‍රස්තවාදී පණිවිඩ

හෝ තොරතුරු පතුරුවා හැරීම සඳහා විද්‍යුත් සන්නිවේදන තාක්‍ෂණය භාවිතා කිරීම" වශයෙනි. (Cyber Guardian 2019). විද්‍යුත් සංනිවේදන තාක්ෂනය හා බැදුනු මෙම "සයිබර් වෛරය " පුලුල් වපසරියක් පුරා පැතිරී පවතියි. විද්‍යුත් සංනිවේදන තාක්ෂනය තුළ අන්තර්ජාලය යනු එක් ප්‍රධාන අංගයකි. මෙම ලිපිය තුලදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ අන්තර්ජාලයේ අතුරු නිශ්පාදනයක් වන සමාජ මාධ්‍යන් තුල ලංකාවේ වෛරී කථනයේ ස්වරූපයන් ගවේශනය කිරීම වෙතටය. මෙම වෛරී කථනය ආගම, ජනවාර්ගිකත්වය, ජාතිකත්වය, ජාතිය, වර්ණය, සම්භවය, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගිකත්වය හෝ වෙනත් අනන්‍යතා සාධක මත පදනම් වන අතර මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ ආගම, ජනවාර්ගිකත්වය සහ ජාතිය පදනම්ව සිදුවන වෛරී ප්‍රකාශයන්ගේ ස්වරූපය පරීක්ෂාකිරීමයි.

**මුස්ලිම් විරෝදය හා බැදුනු සමාජ මාධ්‍යන්හි වෛරී කථනය**

2013 අගෝස්තු 10 සෙනසුරාදා කොළඹ ග්‍රෑන්ඩ්පාස්හි චෛත්‍ය පාරේ පිහිටි මස්ජිඩ් දීනුල් ඉස්ලාම් මුස්ලිම් යාච්ඤා මධ්‍යස්ථානයට ප්‍රහාරයට ලක් විය. ප්‍රචණ්ඩත්වය පාලනය කිරීමට අසමත් වූ පොලීසිය ප්‍රදේශයේ ඇඳිරි නීතිය පැනවීය. මස්ජිඩ් මධ්‍යස්ථානයට ප්‍රහාරය එල්ල වූයේ —මග්රිබ් හෙවත් සන්ධ්‍යා යාච්ඤාව අතරතුර කඩා වැදුණ ු කලහකාරී පිරිස් විසින් වන අතර ඔවුන්ට නායකත්වය දුන්නේ බෞද්ධ භික්ෂූන් බව කියනු ලැබිණ. ... ප්‍රහාරය නිසා කෝපයට පත් කලහකාරී මුස්ලිම් තරුණ පිරිස් තම පූජනීය ස්ථානයට තව දුරටත් ප්‍රහාර එල්ල වීම වැළැක්වීම පිණිස වීදි වල පෙළපාලි දැක්වූහ (Bastians 2013). මින් පසු වඩාත් ම කැපී පෙනෙන මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය හට ගත්තේ ශ්‍රී ලංකාවේ දකුණට වන්නට පිහිටි අලූත්ගම ප්‍රදේශයෙහි 2014 ජූනි 15 දින ය. කොළඹ ඇමරිකානු තානාපති කාර්‍යාලය පුද්ගලයන් හතර දෙනෙකු ඝාතනයට ලක්කරමින් 80 දෙනෙකුට වැඩි ප්‍රමාණයකට බරපතල තුවාල සිදුකරමින් විශාල දේපල හානියක් සිදුකෙරුනු මෙම හිංසාකාරී ක්‍රියාව දැඩිලෙස හෙලා දකින ලදී (Aljazeera,2014) මෙම සිදුවීමේදී මුස්ලිම් ප්‍රජාවට අයත් නිවාස හා ව්‍යාපාරික ස්ථාන 60 කට වැඩි ප්‍රමාණයක් ගිනි තබා විනාශ කෙරුනු අතර මුස්ලිම් පල්ලි කිහිපයකටද අලාබහානි සිදුකරණ ලදී. (Aljazeera,2014)

මුස්ලිම් ප්‍රජාවට එරෙහි ප්‍රචණ්ඩත්වය වඩාත් ම කැපී පෙනුණේ ග්‍රෑන්ඩ්පාස් හා අලූත්ගම සිදුවීම්වල දී වුවත් වෙසෙසින් ම 2012 වසරේ සිට බොහෝ අන්තවාදී, ස්වයං ප්‍රකාශිත සිංහල බෞද්ධ කණ්ඩායම් ඔන්ලයින් (සමාජ මාධ්‍ය) සංවාද මණ්ඩප තුළ දී ද සැබෑ ලෝකයේ සිදුවීම් තුළ දී ද මුස්ලිම් විරෝධී ප්‍රලාප වේදිකාරූඪ කොට පතුරවා හැර ඇත(BBC, 2014). අලූත්ගම සිදුවීම ආශ්‍රතව සමහර ෆේස්බුක් පිටු වෛරී කථනය නිපදවීමට දායක වූ ආකාරය නිරීක්ෂණය කරමින් ශිල්පා සමරතුංග සහ සංජන හත්තොටුව ගේ අධ්‍යයනය පෙන්වා දෙන්නේ "කෙසේ වුව ද අලූත්ගම ප්‍රචණ්ඩත්වය අතරතුර දී ගන්නා ලද මෙම තිර දර්ශනය අද දින ශ්‍රී ලංකාව තුළ වෛරී කථනයේ අනුගාමිකයන්ව සිටින හා එය නිපදවන වයස් කණ්ඩායම් පිළිබඳ මනා සංඥාවකි. එපමණක් නො ව 2014 ජූනි 12 බ්‍රහස්පතින්දා සුළු වශයෙන් සහ අනතුරුව 2014 ජූනි 14 සෙනසුරාදා සැබවින් ම ප්‍රචණ්ඩත්වය ඇරඹුණු විට විශාල වශයෙන් ක්‍රියාකාරකම් වැඩි වූ ආකාරය ද ඉන් පෙන්නුම් කෙරෙන අතර එය කායික ප්‍රචණ්ඩත්වය අවුළුවමින් ඔන්ලයින් ක්‍රමයට තැපැල් කෙරෙන ප්‍රකෝපකාරී අන්තර්ගතය ඉටු කරන කාර්ය භාරය පිළිබඳ සැලකිලිමත් වීම් තවත් ශක්තිමත් කරයි." යනුවෙනි.

මැදි වයසේ සිංහල ජාතික ලොරි රියදුරෙකු විසින් සිදුකරණ ලද රිය අනතුරක් සමග මුස්ලිම් ජාතික තරුණයින් හතර දෙනෙකු විසින් රියදුරාට පහරදීමෙන් දින හතරකට පසු සිංහල ජාතික රියදුරා මිය යෑමත් සමග සිංහල කලහාකාරී පිරිස් විසින් 2018 මාර්තු 05 වනදා නුවර දිස්ත්‍රික්කයේ උඩු පුස්සැල්ලෑව හා තෙල්දෙනිය ප්‍රදේශවල මුස්ලිම් ජනයාගේ දේපට වලට පහර දීමට පටන් ගැණුනු අතර එම ප්‍රහාරයන් පසුව දිගන හා තෙන්නෙකුඹුර ප්‍රදේශ දක්වා පැතිරිනි. පොලිස් මාධ්‍ය ප්‍රකාශක රුවන් ගුනසේකර මහතා ප්‍රකාශකර සිටියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හෝමාගම හා

කොල්ලුපිටිය ප්‍රදේශවලින් වයස අවුරුදු 17 සහ 18 ක තරුණයින් දෙදෙනෙකුව නුවර සිදුවීමට අදාලව සමාජ මාධ්‍යන් තුළ වෛරී කථනය ඇවිස්සීම සම්බන්දයෙන් අත්අඩංගුවට ගත් බවයි (Daily News,2018). මහනුවර ප්‍රදේශයේ ගැටුම් ගැන කටකතා පැතිර යමින් පවතින අතරවාරයේ ව්‍යාජ ප්‍රකාශන පතුරුවා හැරීම සඳහා සමාජ ජාල මාධ්‍ය උපයෝගී කර ගන්නා බවට තොරතුරු ලැබීමෙන් අනතුරුව ආණ්ඩුවේ නියෝගය පරිදි ඊට අවහිර කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම විසින් පියවර ගනු ලැබුණි(BBC,2018).

සමස්ත දිවයින ආවරණය කෙරෙන මට්ටමින් සහ සියලු සමාජ ජාල මාධ්‍යයන්ට බල පැවැත්වෙන මට්ටමින් ශ්‍රී ලංකාව තුළ මෙවැනි අවහිර කිරීමක් සිදු වූ පළමු අවස්ථාව මෙය බවත් මීට පෙර අන්තර්ජාල සබඳතා බිඳ වැටුණ අවස්ථා කීපයක් තිබෙන නමුත් ඒවා සිදුවූයේ තාක්ෂණික හේතු මත 2000 වසරට පෙර බව චානුක වත්තේගම මහතා බීබීසී සිංහල සේවයට ප්‍රකාශ කලේය. තවදුරටත් ඔහු ප්‍රකාශකර සිටියේ “මහනුවර තත්වය නරක අතට හැරෙමින් තිබියදී එම ප්‍රදේශයේ ජීවත් නොවෙන පිටින් පැමිණි පිරිසක් කණ්ඩායම් ගැසීම සඳහා පුද්ගලයන් එකතු කර ගැනීමට සමාජ ජාල මාධ්‍ය පාවිච්චි කරන හැටි අපි දැක්කා. ඉතින් එවැනි අවස්ථාවක ආණ්ඩුවලට කලබල නතර කිරීමට මෙවැනි ආන්තික පියවර ගන්න සිද්ධ වෙනවා” යනුවෙනි (BBC,2018).

ලංකාව තුළ විටින් විට පැන නගින මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වයන් හා මුස්ලිම් ජනයාට එරෙහිව සමාජ මාධ්‍යන් තුළ ප්‍රකාශ වන වෛරී කථනයන් එකිනෙකින් ප්‍රතිපෝෂණය වන ආකාරය මේ අනුව අපට නිරීක්ෂණය කල හැක. ෆේස්බුක් හරහා ප්‍රධාන වශයෙන් සිංහල භාෂාවෙන් ප්‍රකාශයට පත්වන වෛරී කථනයන් පාලනය කිරීම සම්බන්දයෙන් ෆේස්බුක් සමාගමේ මද අවධානය පිළිබඳව සමාජ ක්‍රියාකාරීන් තම අවධානය යොමු කරයි. ශ්‍රී ලංකාවේ ජන කොටස් සම්බන්ධයෙන් වෛරී අදහස් පැතිරවීම සම්බන්ධයෙන් ෆේස්බුක් සමාගම ගෙන තිබෙන පියවරයන් සම්බන්දයෙන් සෑහීමකට පත්විය නොහැකි බව **සමාජ ජාල විශ්ලේෂක** නාලක ගුණවර්ධන ප්‍රකාශ කරයි. ඔහු තව දුරටත් ප්‍රකාශකරන්නේ "මේ දක්වා අරගෙන තිබෙන පියවර මදි, යොමු කරලා තිබෙන අවධානය මදි. 2013 පමණ පටන් අපේ රටේ සිවිල් සංවිධාන, උදාහරණයක් විදියට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වැනි සංවිධාන, කාන්තාව හා මාධ්‍ය සාමූහිකය වැනි සංවිධාන මේ පිළිබඳව සාක්ෂි සහිතව, ලේඛනගතව පෙන්වා දීල තියෙනව...සිංහල භාෂාවෙන් වෛරී ප්‍රකාශ මෙතරම් ප්‍රමාණයක් ගොඩ නැගී පැතිර යන්නට හේතු වුණේ මේ හරහා ගත යුතුව තිබූ පියවර අවශ්‍ය තරම් නොගැනීම නිසයි." ෆේස්බුක් සමාජ ජාලය තුළ සිංහල භාෂාවෙන් පළකෙරෙන වෛරී ප්‍රකාශන නිරීක්ෂණය සහ වාර්තා කිරීම පිණිස උපකාර කරන්නැයි ෆේස්බුක් සමාගම තමන්ගෙන් ඉල්ලා සිටි බව යුධන්ජය විජේරත්න, ග්‍රවුන්ඩ්වීව්ස් වෙබ් අඩවියේ සම කර්තෘ සංජන හත්තොටුව සහ තමන් සමග (මාර්තු 16,2018) ෆේස්බුක් නියෝජිතයන් තිදෙනකු සමග පැවති සමූහ දුරකථන සංවාදයකදී එම ඉල්ලීම කෙරුණු බව නාලක ගුණවර්ධන මහතා ප්‍රකාශ කරණ ලදී. (BBC,2018)

ෆේස්බුක් සමාජ මාධ්‍ය ජාලය එය භාවිත කරන්නන්ගේ නුසුදුසු අන්තර්ගතයන් ඉවත් කිරීමට භාවිත කරන ලද නීති රීති 2018 අප්‍රේල් 24 ප්‍රසිද්ධියට පත් කළේය (ලංකාදීප, 2018). ෆේස්බුක් සමාජ මාධ්‍ය ජාලය භාවිත කරන්නන්ගේ අන්තර්ගත ඉවත් කිරීමට භාවිත කරන ලද හා පදනම් කරන ලද නීති මෙලෙස ප්‍රසිද්ධියට පත් කරන ලද්දේ පළමු වරටය. අන්තර්ගත ඉවත් කිරීමේදී ඊට පාදක වූ ප්‍රමුඛතම කරුණු වූයේ වෛරී ප්‍රකාශ, ප්‍රචණ්ඩකාරී තර්ජන, ලිංගික හිරිහැර හා වදහිංසා යනාදියයි. 2018 නොවැම්බර් 27 වන දින ව්‍යාජ පුවත් සහ අනිශ්ධ තොරතුරු සම්බන්දයෙන් ලන්ඩනයේ පැවති ජාත්‍යන්තර තඩු විභාගයේදී ෆේස්බුක් සමාගමේ ප්‍රතිපත්ති විසඳුම් පිළිබඳ උප සභාපති රිචඩ් ඇලන් මහාදිගත සිදුවීමට අදාලව ශ්‍රී ලංකාව තුළ වාර්ගික වෛරය ඇතිකරන තැපැල් කිරීම් නතිතම් පෝස්ට් ඉවත් නොකිරීමෙන් ෆේස්බුක් සමාගම වරදක් සිදුකර ඇතිබව ප්‍රකාශ කලේය. (Daily mirror,2018).

2019 අප්‍රේල් 21 වන දින පාස්කු බෝම්බ ප්‍රහාරයත් සමග ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් සමාජ මාධ්‍ය දින නමයක් දක්වා, අප්‍රේල් 21 සිට 30 දක්වා සමාජ මාධ්‍ය ක්‍රියාකාරීත්වය අත්හිටුවීමට නියෝග කෙරිනි. තහනම පිටුපස වූ හේතුව වූයේ ප්‍රචණ්ඩත්වය අවුළුවන ව්‍යාජ ප්‍රවෘත්ති සහ වෛරී කථනය පැතිරීම වැළැක්වීමයි. නමුත් සමාජ මාධ්‍ය මත පනවා තිබූ අවහිරය ඉවත් කිරීමත් සමග ලංකාවේ සමාජ මාධ්‍ය තුළ මුස්ලිම් ජනයාට එරෙහිව වෛරී කථනය නැවත ඉදිරියට පැමිනියේය.

ඉරිදා... ආරම්භ වූ මුස්ලිම් විරෝධී නොසන්සුන්තාවයේ දී, මැර පිරිසක් ශ්‍රී ලංකාවේ වයඹ දෙසින් පිහිටි නගර හතක ගෙවල් පල්ලි කොල්ලකෑම, කුර්ආන් පුළුස්සාදැමීම සහ පෙට්‍රල් බෝම්බවලින් වෙළඳසැල්වලට පහර දුන් බව ප්‍රදේශවාසීහු පවසූහ බලධාරීන් විසින් කලහකාරී පිරිස් දුසිම් ගණනින් අත්අඩංගුවට ගැණුනු අතර ඉන් තිදෙනෙකු 2018 නුවර සිදුවීමටද සම්බන්ද සිංහල බෞද්ධ අන්තවාදීන් බව ද ප්‍රකාශ විය (Aljazeera,2019).

ප්‍රචණ්ඩත්වය ඇති වූ විගසම ෆේස්බුක් හි පළ වූ ලිපි විශ්ලේෂණය කිරීමේදී, විශේෂයෙන් පාස්කු ඉරිදා ප්‍රහාරය සංවිධානය කෝලාහලය, වෛරී පණිවුඩ තරුණ පරම්පරාව ඉලක්ක කරගත් බව හඳුනාගත හැකි අතර ඔවුන් පණිවිඩ වේගයෙන් ව්‍යාප්ත කළ අතර එවැනි සිදුවීම් වලදී බෙදාගැනීමේ (shares) සංඛ්‍යාව ද විශාල ලෙස ඉහළ ගොස් ඇති බව පැහැදිලිය. එපමණක් නොව, එවැනි වෛරී පෝස්ට් බොහොමයක්ම තරුන පරම්පරාව ආකර්ශනය කරගන්නා ආකාරයට නිර්මාණය වී ඇති අතර බොහෝ පණිවිඩ ඉල්ලාසිටින්නේ පෝස්ටුවෙහි පණිවිඩය බෙදාගැනීමට හෝ එයට අදාලව ක්‍රියාසිදු කිරීමට ය. එවැනි සිදුවීම් අතරතුර සහ පසුව, ෆේස්බුක් පිටුවල වෛරී පණිවිඩ යළිත් වට්ස්ඇප් කණ්ඩායම් හරහා පවතු ලබේ (Cyber Guardian 2019). නව මාධ්‍ය ක්‍රියාකාරිකයෙකු සහ පුවත්පත් කලාවේදියෙකු වන රයිසා වික්‍රමතුංග ප්‍රකාශ කරන්නේ “විශේෂයෙන්ම වට්ස්ඇප් පනිවිඩ සදහා සෘජුවම ස්ථානයක් නිශ්චිත ඉලක්කයක් ඇති අතර, මිනිසුන්ට නිශ්චිත ස්ථානයකට යන ලෙස, නිශ්චිත පරිශ්‍රයකට හෝ නිශ්චිත ව්‍යාපාරික ස්ථානයකට පහරදෙන ලෙස කියා සිටිනව. ෆේස්බුක් සහ ඉන්ස්ටග්‍රෑම් වැනි විවෘත වේදිකාවලට වඩාවට්ස්ඇප් හි එය සිදුවෙමින් පවතිනව. අපරාධ විමර්ශකයින්ට හෝ පර්යේෂකයන්ට මේ සම්බන්දයෙන් විමර්ශනයන් සිදුකිරීම වඩාදුෂ්කර කෙරී තිබෙනව” යනුවෙනි(Cyber Guardian 2019).

පහත වගුවේ දක්වෙන්නේ 2019 ජනවාරි 09 සිට 2019 ජූලි 31 වෙනිදාදක්වාවෛරී ප්‍රකාශයන් ප්‍රවර්ධනය කල ලංකාවේ ෆේස්බුක් පිටු දහයක් තුළ පෝස්ට් (තැපැල් කිරීම) සහ තැපැල් කිරීම් හි ස්වරූපය පිළිබඳ සංඛ්‍යාවත්ය.

| ෆේස්බුක් පිටුව | පෝස්ට් ප්‍රමාණය | ජායාරූප පෝස්ට් | වීඩියෝ පෝස්ට් | පෝස්ට්- සබදතා | රසිකයන් විසින් පෝස්ට් කිරීම |
|---|---|---|---|---|---|
| Ceylon Blood | 536 | 486 | 47 | 1 | 1 |
| මනංකල්පිත | 70 | 47 | 21 | 0 | 1 |
| Sinhala Lanka Organization | 363 | 276 | 78 | 1 | 3 |
| සිංහලයා | 22 | 12 | 5 | 5 | 11 |
| මම සිංහල ඇයි අවුල්ද? | 88 | 87 | 0 | 0 | 0 |
| මල්වඩම | 319 | 288 | 16 | 2 | 0 |

| | | | | | |
|---|---|---|---|---|---|
| සිංහල පාරිභෝගික හා වෙළඳ සංගමය | 189 | 169 | 5 | 11 | 16 |
| සිංහල විද්වත් එකමුතුව | 82 | 69 | 10 | 0 | 0 |
| සිංහලයන් සුරකිමු | 302 | 283 | 9 | 8 | 1 |
| සිංහලේ වැසියන් | 292 | 212 | 43 | 6 | 15 |

(Cyber Guardian, 2019)

ඉහත සඳහන් වෛරී කථනය ප්‍රවර්ධනය කල ෆේස්බුක් පිටු අතරින් මල්වඩම, සිංහලේ වැසියන්, Sinhala Lanka Organization, Ceylon Blood යන ෆේස්බුක් පිටු මේවන විට භාවිතයේ නොමැත. බොහෝවිට සිදුවන්නේ මෙවැනි පිටු වෙනත් නම් වලින් නැවත පවත්වාගෙන යාමයි. ඉහත සඳහන් මේ වනවිට භාවිතයේ නොමැති ෆේස්බුක් පිටු හැර භාවිතයේ පවතින පිටු අතරින් ෆේස්බුක් පිටු පහක 2020 මාර්තු 01 දා සිට දෙසැම්බර් 15 දක්වා වන දළ හැසිරීම පහත පරිදිය.

ෆේස්බුක් පිටුව - "මම සිංහල ඇයි අවුල්ද?"
පෝස්ට් සංඛ්‍යාව - 15
වෛරී කථනය ප්‍රකාශවී ඇති අන්තර්ගතයන් ගණන - 03
නොවැම්බර් 10
"ආණ්ඩුවේ මොට්ට තීරණයක් සමාජ ගැටලුවක් නිර්මාණය කරන අයුරු. ආගමික අයිතිය සැමට සමානව තිබුය යුතුය"- වෙබ් සබැදියාව හා සම්බන්ද ලිපිය-Cabinet rules to allow burial of COVID-19 victims/DailyFT
"කොරෝනාවෙන් මිය යන බොදුනුවන්ටද පාංශුකූලය දීමට අවශ්‍යයි"(ආදාහන ජායාරූපය)
අප්‍රේල් 03 "ඉස්ලාම් භූමදානය පිළිබඳ ඇත්ත කතාව" (ජායාරූපය සමග ලිපිය)-
(මතුපිටින් වෛරී කථනයක් යැයි නොපෙනෙන තැපැල් කිරීමකට උදාහරණයක්)
මාර්තු 31
"කොරෝනා සෑදී මියගිය මුස්ලිම් ජාතිකයා අදාහනය කිරීමට එරෙහිව මුස්ලිම් දේශපාලකයන් සහ .... විරෝදයක" නෙත්FM (රවුෆ් හකීම්ගේ ජායාරූපයක් සමග), "ආදාහනය කරේ නැත්නම් කන්‍යාවියෝ 72 ටත් බෝවෙන්න පුලුවන් ආයුබෝවන්ඩ. තේරුම් ගන්න"

ෆේස්බුක් පිටුව - "සිංහල විද්වත් එකමුතුව"
පෝස්ට් සංඛ්‍යාව - 115
වෛරී කථනය ප්‍රකාශවී ඇති අන්තර්ගතයන් ගණන - 06
දෙසැම්බර් 08 - "හරක් අරක් ගත් ජල ගැලුම් නිම්නය ගිනි ගනියි" - නොවැම්බර් 13 මුස්ලිම් ජනයාගේ කොවිඩ් ආසාදිත දේහ භූමදානයට විරුද්ධව දිවයින පුවත්පතේ පල වූ බෙන්ගමුවේ නාලක හිමියන්ගේ ලිපියක් "අලි සබ්රි අධිකරණ ඇමැති වූ පළියට රටේ නීති වෙනස් කරන්න දෙන්න බැහැ - බෙංගමුවේ නාලක හිමියෝ

ඔක්තෝබර් 18 – “බද්යුදීන් හුරතල් කිරීම, කල්පිටිය, විල්පත්තුව මන්නාරම හා සෆිස්ථාන් සැලැස්ම”. “ ඩොලර් කුට්ටි හේතුවෙන් පකිස්ථානු හා බංගලාදේශ මහමදිකයන් වයඹ වෙරළ තීරයේ පදිංචි කිරීමට අවසරදීම“ - තැපැල් කිරීමට අදාල සංවිධානයේ හේතුපාටය - සිංහලයේ ඓතිහාසික ජාතික විමුක්ති අරගලයේ පුනරාගමනය

අගෝස්තු 23 – “විග්නේශ්වරන් මහල්ලාගේ උමතුව හා පාර්ලිමේන්තුවේ දේශප්‍රේමී බහුතරයේ නිහැඩියාව“තැපැල් කිරීමට අදාල සංවිධානයේ හේතුපාටය - සිංහලයේ ඓතිහාසික ජාතික විමුක්ති අරගලයේ පුනරාගමනය

අප්‍රේල් 04 - “ AMNESTY INTERNATIONAL- කොරෝනා අන්තවාදී අනතුර “ කොවිඩ් ආසාදිත මුස්ලිම් ජාතිකයන්ගේ මරණ භූමදානයට එරෙහිව

අප්‍රේල් 01- "නිකමට කිව්වේ සර්... අපේ එවුන්ගෙන් බේරෙන්න බෑ..සර්"( ජනාධිපති ගෝඨාබයගේ ජායාරූපය සමග) "හකීම් උඹට වළලන්නම ඕනෙද"(හකීම්ගේ ජායාරූපය සමග) "විහිලුවක් වත් තේරෙන්නෑනෙ සර්ට"

අප්‍රේල් 01- “දිල්ලියෙහි තබ්ලිත් ජමාත් මූලස්ථානය වසා දමයි. හකීම් රට ගිනි ගනිද්දී සුරුට්ටු පත්තුකරයි” මෙම ජායාරූපය යටතේ ඇති ලිපිය මතුපිටින් වෛරී කථනයක් නොපෙනුනද, ලිපියේ සමස්ථ අර්ථය තුළ මතුකෙරෙන්නේ වෛරී කථනයකි.

ෆේස්බුක් පිටුව - “සිංහල පාරිභෝගික හා වෙළඳ සංගමය”
පෝස්ට් සංඛ්‍යාව - 14
වෛරී කථනය ප්‍රකාශවී ඇති අන්තර්ගතයන් නොමැත

ෆේස්බුක් පිටුව - මනක්කල්පිත
පෝස්ට් සංඛ්‍යාව - 29
වෛරී කථනය ප්‍රකාශවී ඇති අන්තර්ගතයන් නොමැත

ෆේස්බුක් පිටුව - සිංහලයන් සුරකිමු
පෝස්ට් සංඛ්‍යාව - 2019 දෙසැම්බර් මාසයෙන් පසුව තැපැල්පත් කිරීම් සිදුවී නොමැත.

ඉහත උදාහරණයන් සමග සමාජ මාධ්‍යන්හි වෛරී කථනය ප්‍රකාශයට පත්වන ආකාරය පරීක්ෂා කිරීමේදී, සමාජය තුළ ඒ කාලයට අදාලව පවතින හිංසාකාරී හා බැහැරකිරීම්වාදී ක්‍රියාවන්හෝ කථිකාවන් සමාජ මාධ්‍ය තුළ වෛරී කථනයන් වශයෙන් ප්‍රකාශයට පත්වන අයුරු අපට දැකගත හැකිය. වෛරී ක්‍රියාවන් හා කථිකාවන් සමාජය තුළ බලවත්වන ස්වරූපයට සාපේක්ෂව තැපැල් කිරීම් අඩු වැඩි වන ආකාරයද අපට නිරීක්ෂනය කල හැකිය. මේ හරහා සමාජය තුළ එම අවධියෙහි අධිනිශ්චය වන වෛරී ක්‍රියාවන් හා සමාජ මාධ්‍ය තුළ ප්‍රකාශ වන වෛරී කථනයන් එකිනෙකින් ප්‍රතිපෝෂණය වන ආකාරයද අපට නිරීක්ෂනය කල හැකිය.

2019 සයිබර් ගාඩියන් වාර්ථාව ප්‍රකාශ කරන පරිදි වෛරී කථන පෝස්ට් මගින් ප්‍රකාශ වන මූලික සාදක තුනක් හදුනාගත හැකිය.

1. අනාරක්ෂිත බව - සුළුතර ප්‍රජාවේ ජනගහනය ශ්‍රීග්‍රයෙන් වර්ධනය වන අතර බහුතර ප්‍රජාව අනාගතයේ දී සුළුතරය බවට පත්වීමේ තර්ජනයකට මුහුණ දී සිටිති යන අදහස.

2. ආර්ථිකය - සුළුතර ප්‍රජාවට පාලක පක්ෂය සම්බන්දයෙන් ප්‍රබල බලපෑමක් හා පාලනයක් පවතින බවත් ඔවුන්ට බහුතරයට වඩා වැඩි වරප්‍රසාද ලබා දෙන බවත්ය. එදිනෙදා ජීවත්වීම සඳහා අරගල කරන

පුද්ගලයින්ට හැඟෙන්නේ ඔවුන්ගේ ජීවන අරගලයට හේතුව ව්‍යාපාරික හා ආර්ථික ක්‍රියාකාරකම් පාලනය කරන සුළුතරය බවයි.

3. හැඟීම් -වෛරී පෝස්ට් මගින් "අපගේ ප්‍රජාව අප විසින් ආරක්ෂා නොකරන්නේ නම්, කිසිවෙකු අපව ආරක්ෂා නොකරනු ඇත" වැනි සටන් පාඨ භාවිතා කරමින් හැඟීම්, තත්වයන් සහ හැසිරීම් හසුරුවයි. එවැනි පෝස්ට් හි බලය, නිර්භීතකම, මාතෘ භූමිය, වීරයන් වැනි රූප අඩංගු වේ.

දණ්ඩ නීතිය, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යනු ඉතා පැහැදිලිව ලංකාව තුළ වෛරී කථනය වැලැක්වීම සම්බන්දයෙන් භාවිත කලහැකි රෙගුලාසීන්ය. නමුත් මෙම ලිපිය සඳහා පාදක කරගත් බොහෝමයක් මූලාශ්‍රයන් පෙන්වාදෙන්නේ ලංකාවේ සමාජ මාධ්‍ය හරහා ප්‍රකාශයට පත්වන වෛරී කථනයන්ට එරෙහිව පවතින මෙම නීති හරහා පැහැදිලි ක්‍රියාමාර්ගයන් නොගන්නා බවයි.

"පැහැදිලිව පෙනෙන දෙය නම් ඔන්ලයින් ක්ෂේත්‍ර හා අන්තර්ගතය විමසා බලන නව නීති සම්පාදනය නො කර වුව ද වෛරී කථනයේ යෙදෙන්නන් ඔවුන් නිර්මාණය කරන වාචික හෝ කායික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වග වන තත්ත්වයට පත් කළ හැකි නීතිමය පිළියම් හා රාමු ගණනාවක් පවතනි බව යි. ගැටලුව වී තිබෙන්නේ අදාළ නීතිමය රාමු නොපැවතීම නො ව ඒවා අදාළ කර නොගැනීම හෝ තෝරා ගත් අවස්ථාවල පමණක් අදාළ කර ගැනීම යි." (ප්‍රචණ්ඩත්වයට කැමති වීම, 2014).
නෙවිල් උදිත වීරසිංහ